**කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන - 2023**

**----------------------------------------------------------------**

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන(SAPP) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල(IFAD) අතර 2017 ජුනි 26 දින එළඹි අංක 2000001843 දරන ණය ගිවිසුම, 2017 නොවැම්බර් 21 දින එළඹි අංක 2000001984 දරන ණය ගිවිසුම හා 2019 මැයි 16 දින එළඹි අංක 2000002639 දරන ණය ගිවිසුමේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතයා වන අතර කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

වාණිජමය වශයෙන් අරමුණු කරගත් නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධතියට සම්බන්ධ කුඩා පරිමාණ කුටුම්භයන් 57,000කගේ ආදායම සහ ආහාරයන්හි ගුණාත්මක බව තිරසාර ලෙස ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වාණිජ හවුල්කාරිත්වයට ප්‍රවේශය, ග්‍රාමීය මූල්‍යයට ප්‍රවේශය සහ වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්ති යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 17,170 කට සමාන වූ ඇමරිකානු ඩොලර් මිලියන 105.03 ක් වන අතර ඉන් රු.මිලියන 8,892 කට සමාන වූ ඇමරිකානු ඩොලර් මිලියන 54.4 ක් සැපයීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 8,278 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2017 ජුනි 26 දින ආරම්භ කරන ලද අතර, 2023 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2025 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී .

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි අංක 754/756 | වැඩසටහන මගින් 2023 වසර සඳහා බඩු ලේඛන පොත නිසියාකාරව සකස් කර නොතිබූ අතර 2024 පෙබරවාරි 28 වන විට මූල්‍ය රෙගුලාසි අංක 754/756 අනුව තුලනය කර නොතිබුණි. තවද, 2021 සහ 2022 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණ 2024 පෙබරවාරි 28 වන විට සිදු කර නොතිබුණි. | පැතුරුම්පත් වැඩ පොත (Excel) ස්ථාවර වත්කම් ලේඛනය ලෙස පවත්වාගෙන යනු ලැබේ. 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇති අතර වාර්තාව ලබා ගත හැකිය. ව්‍යාපෘතිය විසින් පත් කරන ලද සමීක්ෂණ මණ්ඩල කමිටුවට 2022 භාණ්ඩ සමීක්ෂණය සම්පූර්ණ කිරීමට නොහැකි විය. 2023 භාණ්ඩ සමීක්ෂණය ක්‍රියාත්මක වන අතර 2024 ජූනි 15 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |

## 2.2 නොපියවූ ශේෂයන්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2023 ජුනි 15 දින ගෙවන ලද රු. 301,950 ක කාර්යමණ්ඩල අත්තිකාරම් මුදල 2023 දෙසැම්බර් 31 දින දක්වා පියවා නොතිබුණි. | ඇතැම් පිළිගත නොහැකි බිල්පත් හේතුවෙන් අත්තිකාරම් ලබාගත් වගකිවයුතු නිලධාරියාගෙන් නිදහසට කරුණු විමසා ඇත. එය නිසි පියවීම් වවුචරයක් ලෙස ලැබී නොමැති බැවින්, ගිණුම්කරණ කටයුතු සඳහා එම වියදම් නොපියවූ ලෙස පවතී. මෙම ගැටළුව නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | අත්තිකාරම් වහාම පියවිය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| අංක | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය 2017 ජුනි 26 **දින ආරම්භ වූ අතර** 2023 දෙසැම්බර් 31 දින වන විට සියයට 88**ක** ඉලක්කයක් ලගා කරගැනීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්**,** 2023 දෙසැම්බර් 31 වන විට භෞතික ප්‍රගතිය සියයට 69 ක් පමණක් ලගා කරගෙන තිබුණි**.** | 2024 අප්‍රේල් 30 වන විට, ගැලපුම් ප්‍රදාන පිරිනැමූ ගොවීන් 40,686 න්, ගොවීන් 30,779 ක් එනම් සියයට 76 ක් භෞතිකව ව්‍යාපෘතිවල යෙදී සිටින අතර ඔවුන්ට අවම වශයෙන් එක් ප්‍රදාන අයිතමයක්වත් ලැබී තිබුණි. තවද, 4P ගැලපීමේ ප්‍රදාන යටතේ මූල්‍ය ඉලක්කයෙන් සියයට 40ක් වගකීම්වලට එරෙහිව සපුරා ඇත. | සැලසුම් කර ඇති පරිදි ව්‍යාපෘති කාල රාමුව තුළ ඉලක්කය සම්පූර්ණ කළ යුතුය. |
| (ආ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කළ මුරුංගා වගා ව්‍යාපෘතිය**,** නිලධාරීන්ගේ සහ ප්‍රවර්ධකයාගේ අකාර්යක්ෂමතාව හේතුවෙන් අසාර්ථක වී තිබුණි. ගොවීන්ගේ දායකත්ව වටිනාකම හැර ව්‍යාපෘතියේ දායකත්වය මත බිංදු ජල සම්පාදනය සඳහා වතුර මෝටර් ලබා ගැනීම සඳහා රු**.**මිලියන 25.52ක මුදලක් වැය කර තිබුණි. මුරුංගා ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ වූ ගොවි පවුල් ආර්ථික අර්බුදවලට මුහුණපා තිබුණි. මුරුංගා ව්‍යාපෘතියේ ප්‍රවර්ධකයන් සමඟ එළැඹුනු ගිවිසුම 2021 දෙසැම්බර් 05 දින අවසන් වී තිබුණු අතර ඒ බව ප්‍රවර්ධක වෙත දැන්වීමට වැඩසටහන් අධ්‍යක්ෂ විසින් මාස 18 කට අධික කාලයක් ගත කර තිබුණි. | කොවිඩ් 19 කාලය දක්වා, සැලකිය යුතු මූලික ප්‍රගතියක් පෙන්නුම් කරමින්, ගොවීන් 116 දෙනෙකු සමඟ මුරුංගා ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. වෙළඳපල කඩාවැටීම හේතුවෙන්, අපනයන වෙළඳපොලේ ඇති අභියෝග නිසා ප්‍රවර්ධකයා මිලදී ගැනීම අත්හිටුවා ඇත. ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමට බලපාන මූලිකම ගැටලුව වනුයේ අපනයන ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනය සියයට 100ක් කාබනික වීමේ අවශ්‍යතාවයයි. පාංශු අපද්‍රව්‍ය අනාවරණය වීම හේතුවෙන්, දැනට ව්‍යාපෘතියට මෙම දැඩි කාබනික නිර්ණායක සපුරාලිය නොහැක. අපනයන සීමාවන් සැලකිල්ලට ගෙන, ව්‍යාපෘතිය දේශීය වෙළෙඳපොළ ඉල්ලීම් ඉටු කිරීම කෙරෙහි එහි අවධානය වෙනස් කර ලදී.කෙසේ වෙතත්, මෙම වෙනස් කිරීම අපේක්ෂිත අපනයන ඉලක්ක සඳහා සම්පූර්ණයෙන්ම හිලව් කිරීමක් ලබා නොදේ. ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබූ නමුත් කාබනික සහතික කිරීමේ අවශ්‍යතා සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් අවසානයේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනට ව්‍යාපෘතිය අත්හිටුවීමට සිදු විය. | ප්‍රවර්ධකයන්ට ප්‍රදාන ලබාදීමට පෙර, ඔවුන්ගේ ව්‍යාපාර අධීක්ෂණය කළ යුතුය. අකාර්යක්ෂම ප්‍රවර්ධකයන්ගෙන් සහ අදාළ නිලධාරීන්ගෙන් ගෙවන ලද ප්‍රදානය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුත්තලම දිස්ත්‍රික්කයේ කුඩා පරිමාණ පාරම්පරික වී ගොවීන්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීමත්, ගොවීන්ගේ ආදායම් සහ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමත් අරමුණු කරගත් පැරබෝවා පාරිසරික ගොවි සංවිධානය වෙත සහ ප්‍රතිලාභී ගොවීන් සඳහා රු. මිලියන 4.5 ක ප්‍රදානයක් ලබාදී තිබුණි. ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා පැරබෝවා පාරිසරික ගොවි සංවිධානය ගොවීන් සමඟ ගිවිසුම් වී තිබුණද පැරබෝවා පාරිසරික ගොවි සංවිධානයේ සභාපතිවරයාට අයත් පැරබෝවා එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම විසින් වී මිලදී ගෙන තිබුණි. | ප්‍රථමයෙන් පැරබෝවා ගොවි සංවිධානය සාමාජික ගොවීන්ගෙන් වී මිලදී ගෙන පසුව පැරබෝවා එක්ස්පෝට් පුද්ගලික සමාගමට අලෙවි කරයි. තවදුරටත් ගොවි සංවිධානය විසින් ගොවිබිම් සංවිධානය කිරීම සහ මිලදී ගැනීම සඳහා ක්ෂේත්‍ර නිලධාරියෙකු යොදවා ඇත. | ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූ ගොවි සංවිධානය වී මිලදී ගත යුතු අතර එම සංවිධානය වී මිලදී නොගන්නේ නම් ඔවුන්ට ලබා දී ඇති ආධාර මුදල් අය කර ගත යුතුය. |
| (ඈ) | පැරබෝවා පාරිසරික ගොවී සංවිධානයේ ප්‍රවර්ධක වන පැරබෝවා එක්ස්පෝට් සමාගමේ හිමිකරු විසින් එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය අදියර 01 න් රු. මිලියන 9 ක ප්‍රදාන හා එවකට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවති කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන මඟින් වී ගබඩා ඉදිකිරිම සඳහා රු. මිලියන 2.7 ක ප්‍රදාන ලබාගෙන තිබුණි. කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය අදියර 01 න් ලබාගත් රු. මිලියන 9 ක ප්‍රදානවලින් අපේක්ෂිත කාර්යයන් ද ඉටු කර නොතිබුණි. | පැරබෝවා ව්‍යාපෘතිය යනු ගොවි සංවිධානය සමඟ අත්සන් කරන ලද 4P සංකල්පය යටතේ ඇති අගය දාම වැඩසටහනකි. ගබඩා පහසුකම් පාරම්පරික වී වගා කිරීමේ යෝජනාවට සහ අත්සන් කරන ලද ගිවිසුමට ඇතුළත් වේ. එබැවින්, ගොවීන්ගෙන් එකතු කරන වී අපනයනය දක්වා ගබඩා කිරීම සඳහා අවශ්‍ය වන ගබඩා පහසුකම ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 2.7 ක ප්‍රදානයක් ලබා දෙමින් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන පියවර ගෙන ඇත.<br><br>නූඩ්ල්ස් කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා අපනයන සමාගමට රු. මිලියන 9ක් ලබා දී ඇති බව ප්‍රවර්ධකයා (FO) විසින් අපට දන්වා ඇත. | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් හරහා සම්බන්ධීකරණය කළ යුතුය. |
| (ඉ) | වැඩසටහන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 2500 ක් ඉලක්ක කරමින් රු. මිලියන 292ක් අපේක්ෂිත දායකත්වයක් මත ක්‍රියාත්මක වු ගම්මිරිස් වගා කිරිමේ ව්‍යාපෘතිය සඳහා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන රු. මිලියන 89ක් පමණක් දරා තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක සැලැස්ම අනුව 2020 වර්ෂයේදී ඉටු කල යුතු අස්වැන්න | ආරම්භයේදී අනුමත කරන ලද රු. 2,635,351 ක අයවැයකට යටත්ව පිරිසැකසුම් කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කර ඇත . කෙසේ වෙතත්, වසංගත හා ආර්ථික අර්බුදයෙන් පසු මිල උද්ධමනය හේතුවෙන්, මෙම මුදල ප්‍රමාණවත් නොවන බව සොයා ගන්නා ලදී. | ව්‍යාපෘතියක් තෝරාගැනීමේදී, එහි ප්‍රතිලාභ නැවත ජනතාවට ලැබිය හැකි අයුරින් එය සැලසුම් කර කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම හා ගුණාත්මයෙන් ඉහළ පිරිසැකසුම් මධ්‍යස්ථාන සකස් කිරීමේ කටයුතු ඉටු කර නොතිබුණි. | | |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංක | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩසටහන සඳහා සේවාදායක මෘදුකාංග ප්‍රසම්පාදනය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වල 5.3.10 සහ 5.3.11 ඡේදවලට පටහැනිව කාර්යසාධන සුරක්ෂණයක් හෝ ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව කටයුතු කර තිබුණි. ලංසු ලේඛන විවෘත කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 ඡේදයට පටහැනිව කටයුතු කර තිබුණි. ලංසු විවෘත කිරීම සඳහා කමිටුවක් පත්කර නොතිබුණු අතර තොරතුරු තාක්ෂණ නිලධාරියාගේ තාක්ෂණික නිර්දේශ මත රු. 974,600 ක් වැය කරමින් සේවාදායක මෘදුකාංගය ලබාගෙන තිබුණි. | ඇස්තමේන්තුගත වටිනාකම සැලකිල්ලට ගනිමින්, 2006 ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාරව ලංසු සුරක්ෂණ සහ කාර්යසාධන සුරක්ෂණ අනිවාර්ය නොවන වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් මෙම ප්‍රසම්පාදනය සිදු කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |
| (ආ) | වැඩසටහන මඟින් SAPP/PRQ/GDS/2022/10 දරන කොන්ත්‍රාත් අංකය යටතේ රු.5,654,726 ක් වූ කාර්යාල උපකරණ (මුද්‍රණ යන්ත්‍රයක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, ටෝනර්, ලීබඩු, කැමරාව, ප්‍රක්ෂේපන යන්ත්‍ර 04) ප්‍රසම්පාදනය කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණි. | "කාර්යාල උපකරණ සහ නඩත්තු" ප්‍රසම්පාදන ගොනුව යටතේ රු. 5,654,726 ක වටිනාකමක් සඳහා විවිධ අගයන් යටතේ ප්‍රසම්පාදන කිහිපයක් සිදු කර ඇත. වැඩසටහන් අධ්‍යක්ෂවරයාගේ බලයලත් අධිකාරිය යටතේ ප්‍රසම්පාදන හතරක් ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

**3.3 නිෂ්ක්‍රිය/ අක්‍රිය/ ඌන උපයෝජිත සම්පත්**

| අංක | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය 2023 ජුනි 30 දිනට අවසන් කළ යුතු වුවද, ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් 30 දක්වා ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් අනුමත කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල් භාවිතයේ ප්‍රගතිය සලකා බැලීමේදී, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 54.4 ක වෙන් කළ අරමුදල්වලින් ව්‍යාපෘතිය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 28.16 ක් පමණක් භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. ප්‍රතිශතයක් ලෙස එය සියයට 51.76 ක් වූ බැවින් ඉතිරි වසර දෙකක කාලය ඉතිරි අරමුදල් ප්‍රමාණය සමඟ සලකා බැලීමේදී අරමුදල් භාවිතය අකාර්යක්ෂම බව නිරීක්ෂණය විය. | 2024 මැයි මස අවසානය වන විට, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල් භාවිතය සියයට 63 ක් වන අතර කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන මෙම වසර තුළ සියයට 80 ක ප්‍රගතියක් ලබා ගැනීමට සැලසුම් කර ඇත. | නියමිත කාල රාමුව තුළ ඉලක්කය සම්පූර්ණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සඳහා ශ්‍රී ලංකා රජය විසින් එකඟ වූ මුළු දායකත්වය ඇමරිකානු ඩොලර් මිලියන 19.30 ක් වන අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ දී රාජ්‍ය අරමුදලේ සමුච්චිත භාවිතය ඇමරිකානු ඩොලර් මිලියන 10.25 ක් පමණක් වූ අතර එය එකඟ වූ මුදලින් සියයට 53 ට සමාන විය. මෙම ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් 31 වන දින අවසන් කිරීමට නියමිත අතර ඉදිරි වසර දෙක තුළ එකඟ වූ රජයේ අරමුදලින් ඉතිරි සියයට 47 භාවිතා කිරීම අවිනිශ්චිතය. | 2024 මැයි මස අවසන් වන විට, රජයේ අරමුදල් භාවිතය සියයට 72 ක් වන අතර මෙම වසර තුළ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සියයට 87 ක ප්‍රගතියක් කරා ළඟා වීමට සැලසුම් කර ඇත. | නියමිත කාල රාමුව තුළ ඉලක්කය සම්පූර්ණ කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4,340 ක ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ණය සඳහා වෙන් කළ මුදලින් රු. මිලියන 2,278 ක් පමණක් ව්‍යාපෘතිය සඳහා යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය. එබැවින් මුළු ප්‍රතිපාදනවලින් සියයට 48 ක් නියෝජනය වන පරිදි රු. මිලියන 2,062 ක ප්‍රතිපාදන ව්‍යාපෘතියෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම ඉතිරිය ඇති වූයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය ප්‍රමාද වීම නිසා සැලසුම් කර ඇති පරිදි මිල්කෝ ව්‍යාපෘතිය සඳහා උපකරණ මිලදී ගැනීම මත වූ බදු ප්‍රයෝජනයට ගෙන නොමැතිවීම, රේඛීය නියෝජිතායතනවලින් නිර්දේශිත ගොවි ලැයිස්තු වැනි ආධාරක ලේඛන ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් බඩඉරිඟු බීජ සහ පොහොර වවුචර ලබා දීමට නොහැකි වීම යන හේතු නිසාය.<br><br>රු. මිලියන 2000ක වවුචර්පත් ගෙවීම් සිදු කරන ලදී. කෙසේ වෙතත්, බඩඉරිඟු බීජ, පොහොර සහ ඉඩම් සැකසීම සඳහා මෙම ගෙවීම්වලින් සියයට 90 ක් ගෙවා ඇත්තේ 2024 දී ය. | ව්‍යාපෘතියේ හඳුනාගත් ඉලක්කය නිශ්චිත කාල රාමුවක් තුළ සම්පූර්ණ කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් සමස්ත ප්‍රතිපාදනවලින් සියයට 25 ක් නියෝජනය කරන වැය ශීර්ෂ දෙකකින් ලැබුණු රු. මිලියන 1,876 ක රජයේ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 466.48 ක් භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය. | 2023 නොවැම්බර් මාසයේදී භාණ්ඩාගාරයෙන් අරමුදල් ඉල්ලා ඇතත්, ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රේෂණය කිරීමට අග්‍රිම නිකුත් කර නොමැත. | හඳුනාගත් ඉලක්කය නිශ්චිත කාල රාමුවක් තුළ සම්පූර්ණ කළ යුතුය. |
| (ඉ) | ගොවිපලෙන් බැහැර පහසුකම් සංවර්ධනය කිරීම යටතේ, වැඩසටහන මඟින් ගම්මිරිස් වගා කිරීමේ ව්‍යාපෘතියට අදාලව අඹන්ගඟ කෝරලේ කුඹලොළුව ප්‍රදේශයේ රු. මිලියන 1.7ක වියදමින් ගම්මිරිස් එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සහ රත්තොට, බණ්ඩාරපොල ප්‍රදේශයේ රු. මිලියන 1.7ක වියදමින් ගම්මිරිස් එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට එම මධ්‍යස්ථාන සමස්ත ව්‍යාපෘතිය සඳහා භාවිත කර නොතිබුණි. | විවිධ සාධක නිසා ආරම්භයේදී බලාපොරොත්තු වූ ගම්මිරිස් ප්‍රමාණය එකතු නොවීය. මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධීකරණය කරන ලද මාතලේ දිස්ත්‍රික් ලේකම්වරයාද මෙම ගැටලු අවධාරණය කර ඇත. කෙසේ වෙතත්, අස්වැන්න ප්‍රමාණයට බලපාන බාහිර තත්වයන් හේතුවෙන් ප්‍රයෝජනයක් නොමැතිකම නිසා පහසුකම් දැනට අක්‍රීයව පවතී. | අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කුරුඳු වගා ප්‍රතිලාභීන් 350ක් ඉලක්ක කර තිබුණද, ව්‍යාපෘතිය විසින් තත්‍ය ලෙස හඳුනාගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 85කි. කුරුඳු පිරිසැකසුම් මධ්‍යස්ථාන හතක් ඉදිකිරීමට නියමිතව තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට, කුරුඳු පිරිසැකසුම් මධ්‍යස්ථාන ඉදිකර නොතිබුණි. | සැලසුම් කර ඇති පරිදි පිරිසැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සහ ගොවීන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා විකල්ප ඇගයීම සඳහා අලුතින් පිහිටුවන ලද කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා කර ඇත. | සැලසුම් සහගතව සහ අදාළ අරමුණු ඉටුකරගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කල යුතුය. |
| (උ) | කැවෙන්ඩිෂ් කෙසෙල් වතු ව්‍යාපෘතිය සඳහා, ප්‍රතිලාභීන් 28 දෙනෙකුට රු. මිලියන 15.6ක ණය මුදලක් බැංකු මගින් ලබා දී තිබුණු අතර විගණනය කළ දිනට කෙසෙල් වගාව අසාර්ථක වීම හේතුවෙන් ණය ගෙවීම පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය. තවද කැවෙන්ඩිෂ් කෙසෙල් වගා ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බවත්, ඒ සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවත් නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතිය 2021 ජූලි මාසයේ සිට සාර්ථකව ක්‍රියාත්මක වූ අතර පළමු බෝග චක්‍රයේ අවසානය දක්වාම ක්‍රියාත්මක විය. නමුත් ඉන් පසුව අකාබනික පොහොර අර්බුදය හේතුවෙන් අහිතකර බලපෑමකට ලක්විය. එම කාලය තුළ ආනයනය තහනම් කිරීම හේතුවෙන් අකාබනික පොහොර හිඟයක් ඇති වූ අතර එය ව්‍යාපෘතියට දැඩි ලෙස බලපෑවේය. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 මතභේදාත්මක ගනුදෙනු

| අංක | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෝනගල කෘෂි ඵලදායිතා ගම්මාන සමූපකාර සමිති ව්‍යාපෘතිය යටතේ ගොවීන්ගේ දායකත්වය පසුගිය වර්ෂවලදී වැඩියෙන් දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගොවීන්ගේ දායකත්වයෙන් රු. මිලියන 15ක් අඩු කර දක්වා තිබුණි. ප්‍රතිශතයක් ලෙස, එය සමාලෝචිත වර්ෂයේ ගොවීන්ගේ දායකත්වයේ ආරම්භක ශේෂයෙන් සියයට 59.91 කි. | කහ පොකුරු ව්‍යාපෘතිය - රුහුණු ෆුඩ්ස් යටතේ ගිණුම්ගත කළ යුතු රුපියල් 15,234,648 ක මුදලක් 2022 මූල්‍ය ප්‍රකාශනවල වැරදීමකින් ගෝනගල කහ ව්‍යාපෘතිය යටතේ පෙන්වා දී ඇත. මෙම දෝෂය 2023 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කර ඇත. | ගොවි දායකත්වය නිවැරදිව දැක්විය යුතුය. |
| (ආ) | කළමනාකරණ තොරතුරු පද්ධතිය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 4.88 ක වටිනාකමක් සඳහා ව්‍යාපෘතිය 2022 ජනවාරි 01 වන දින කොන්ත්‍රාත්තුවකට අත්සන් කර තිබුණි. කොන්ත්‍රාත්තුව වසරකුත් මාස දෙකක කාලයක් තුල පස් වතාවක් දීර්ඝ කර ඇති අතර එය 2023 මැයි 31 දිනෙන් අවසන් කිරීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් 2023 නොවැම්බර් 28 දින කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර තිබුණි. | ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බට ගිය ඉන්ධන නොමැතිකම, අධීක්ෂණ සහ ඇගයීම් අංශයේ තනතුරුවල අස්ථාවරත්වය වැනි විවිධ හේතූන් මත කළමනාකරණ තොරතුරු පද්ධතිය පරීක්ෂා කිරීම, පද්ධති විශ්ලේෂණ ප්‍රමාදයන් හේතුවෙන් කළමනාකරණ තොරතුරු පද්ධතිය ගිවිසුම පස් වතාවක් දීර්ඝ කර ඇත. කෙසේ වෙතත්, පද්ධතිය 2023 නොවැම්බර් සිට භාවිතයේ පවතින අතර 2019 වසරේ සිට පද්ධතියේ නොතිබූ දත්ත යාවත්කාලීන කරමින් පවතී. | ව්‍යාපෘති ඉලක්ක කාර්යක්ෂමව හා ඉලක්කගත කාලය තුළ සාක්ෂාත් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතිය 2024 අප්‍රේල් 04 වන විට කළමනාකරණ තොරතුරු පද්ධතියට සියයට 30ක තොරතුරු (සමස්තයක්) පමණක් ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, 4P ව්‍යාපෘති තත්ත්වය, ප්‍රදාන ලබා දීමේ තත්ත්වය සහ ණය ලබා දීමේ තත්ත්වය පිළිබඳ තොරතුරු කළමනාකරණ තොරතුරු පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | මේ වනවිට මුළු ඉලක්කයෙන් සියයට 38ක් සම්පූර්ණ කර ඇත. සති 2-3 කින් ගොවීන් 18,000 කගේ පමණ තොරතුරු ඇතුළත් කරනු ඇත. ගොවිපලෙන් බැහැර ක්‍රියාකාරකම්, ආයතනික ශක්තිමත් කිරීමේ ක්‍රියාකාරකම් වැනි අනෙකුත් තොරතුරු ඇතුළත් කිරීම ද 2024 ජූනි මස අවසන් වන විට අවසන් වනු ඇත. | ව්‍යාපෘති ඉලක්ක කාර්යක්ෂමව හා ඉලක්කගත කාලය තුළ සාක්ෂාත් කරගත යුතුය. |
| (ඈ) | කුලියාපිටිය වීරගම ප්‍රදේශයේ පොල් ත්‍රිකෝණයේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය වෙත කිරි ගොවීන් 150 කු සඳහා ගවගාල් ඉදිකිරීම, ගවයින්ට ජලය සැපයීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීම සහ කිරි එකතු කිරීමේ භාජන ලබා ගැනීම සඳහා මුළු මුදල රු. මිලියන 16 ක් ප්‍රදානය කිරීමට යෝජනා කර තිබුණි. අවස්ථා 12 කදී රු. මිලියන 11ක් නිදහස් කර තිබුණි. | | |
| (i) | කිරි ගොවීන් 150 දෙනෙකු ලියාපදිංචි වී සිටියද ඉන් 26 දෙනෙකු කිරිගොවි කටයුතුවලින් ඉවත් වී තිබුණි. එම කිරිගොවි කටයුතු වලින් ඉවත්වූ ගොවීන් සඳහා ප්‍රදාන ලෙස ලබා දී තිබුණු රු. 635,216 ක් සහ සහනදායි ණය මුදල් ලෙස ලබාදී තිබුණු රු. 1,820,000 ක් නිශ්කාර්ය වියදම් වී තිබුණි. | විවිධ හේතූන් මත ගොවීන් 26 දෙනෙකු ඉවත්ව ගොස් ඇත.කෙසේ වෙතත් මෙම ගොවීන් බැංකුවලින් ලබාගත් ණය පැහැර හැර නොමැත. | නිවැරදි සැලසුම් කිරීම සහ නිවැරදි ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සිදු කළ යුතුය. |
| (ii) | කිරි ගොවි ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් රු. මිලියන 7ක් මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා වියදම් කර තිබුණු අතර රු. 372,000ක් දියදොර අමුණ අලුත්වැඩියා කිරීම සඳහා වෙන්කර තිබුණි. එම මුදල් ව්‍යාපෘතියේ අරමුණට පරිබාහිර කාර්යයක් සඳහා යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. | කිරි ගොවි පවුල් සෘජුව 150 කට සහ වක්‍රව 262 කට ප්‍රතිලාභ සැලසෙන පරිදි ගොවිපළෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 10 ක අයවැයක් වෙන් කර තිබුණි. සෘජු හා වක්‍ර ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනුව, මෙම යටිතල පහසුකම් සංවර්ධනයන් ව්‍යාපෘතියේ අරමුණ සමඟ සමපාත වී ඇත්තේ ගොවිපල යෙදවුම් සහ නිමැවුම් ප්‍රවාහනයට පහසුකම් සැලසීම සහ එමඟින් කිරි ගොවිතැන් කටයුතු සඳහා සහාය වීමය. | ව්‍යාපෘතියේ අරමුණෙන් බැහැර වියදම් වැළැක්විය යුතුය. |
| (ඉ) | පැල්වත්ත ඩේරිස් සහ කොළඹගේ ඩිස්ට්‍රිබියුටර්ස් ලංකා යන ආයතන පිළිවෙළින් කිරි සංවර්ධන සහ බීජ අල සඳහා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සමඟ වසර තුනක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම සමාගම් 2023 දෙසැම්බර් 31 | ව්‍යාපෘතියේ පැලවත්ත කිරි නිෂ්පාදන ව්‍යාපෘති ගිවිසුම 2021 දී අත්සන් කරන ලද අතර 2023 අගෝස්තු දක්වා ව්‍යාපෘතිය ප්‍රවර්ධකයාගේ සතියේ මැදිහත්වීම සහ සම්බන්ධීකරණය හේතුවෙන් ඉතා සෙමින් ගමන් කරයි. | වැඩසටහනේ අරමුණු ඉටුකර ගැනීමට වැඩසටහනේ නිලධාරීන් කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | දින වන විට කිසිදු ප්‍රවර්ධක දායකත්වයක් ලබාදී නොතිබුණි. තවද, එම සංවිධානවල එකඟ වූ කාල සීමාව 2023 ජූලි මාසයේදී අවසන් වේ. ව්‍යාපෘතියේ ප්‍රගතිය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | | |
| (ඊ) | ව්‍යාපෘති නිෂ්පාදකයා ලෙස කටයුතු කරන ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටි ලිමිටඩ් විසින් ලබා දීමට නියමිත දායකත්වයේ වටිනාකම රු. මිලියන 34.6 කි. 2020 දෙසැම්බර් 31 දිනට මෙම සමාගම විසින් ලබා දී ඇති දායකත්වය රු. මිලියන 9 කට ආසන්න වන අතර ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටි ලිමිටඩ් විසින් දක්වා ඇති වියදම්, වාර්තා කරන ලද වියදම්වලට අදාළ කිසිදු ගෙවීම් වවුචරයක් හෝ වෙනත් අදාළ ලියකියවිලි ආයතනය සතුව නොතිබුණු බැවින් පදනම් විරහිත ව්‍යාජ වටිනාකම් බව නිරීක්ෂණය විය. | වාර්තා කරන ලද සියලුම ප්‍රවර්ධක දායකත්වයන් අභ්‍යන්තර විගණකවරයා විසින් ඔහුගේ භෞතික සත්‍යාපනය මගින් හෝ අධීක්ෂණ සහ ඇගයීම් අංශය විසින් ඔවුන්ගේ අධීක්ෂණ යාන්ත්‍රණය මගින් සහතික කර ඇති බැවින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ඉහත නිරීක්ෂණයට එකඟ නොවේ. | ගෙවීමට පෙර, වියදම් අභ්‍යන්තර විගණක සහ අධීක්ෂණ සහ ඇගයීම් අංශය විසින් සහතික කළ යුතුය. |